# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1784/3 — 2012 නොවැම්බර් මස 12 වැනි සඳුදා - 2012.11.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකයඃ 01/10/03/04.

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාත් ආණ්ඩුකාරවර ගරු සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරමි :-

01. බණ්ඩාරවෙල මහ නගර සභාවේ නාගරික කොමසාරිස්, ඩබ්. රන්දෙණිය මහතා 2012.10.01 වැනි දින සිට 2012.12.19 වැනි දින දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ සේවාරම්භක පුහුණුව සඳහා සහභාගි වන බැවින්, 2012.10.01 වැනි දින සිට ඒ මහතා නැවත සේවයට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරි එච්. එම්. ජේ. හේරත් මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව බණ්ඩාරවෙල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරිනි කුසුම් පතිරාජ මහත්මිය 2012.10.01 වැනි දින සිට ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක කටයුතු සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත් කරන තෙක් හෝ 2012.12.31 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

03. පළාත් පාලන කොමසාරිස් (ඌව) එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ මහතා 2012.10.07 වැනි දින සිට 2012.10.11 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.10.07 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, සහකාර පළාත් පාලන කොමසාරිස් (රා.ඉ.) ආර්. එම්. ජයවර්ධන මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව පළාත් පාලන කොමසාරිස් (ඌව) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට,

04. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), චින්තක හෙට්ටිආරච්චි මහතා 2012.10.15 වැනි දින සිට 2012.10.21 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.10.15 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, අධ්‍යක්ෂ (සැලසුම්) එම්. එම්. ආනන්ද විජිත කුමාර මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) තනතුරේ වැඩ බැලීමට,

05. ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක කටයුතු සහ වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය 2012.10.15 වැනි දින සිට 2012.10.21 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.10.15 වැනි දින සිට එම මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විශේෂ ශ්‍රේණිය) නිලධාරි එම්. ඒ. බී. දයා සෙනරත් මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක කටයුතු සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

1A - PG 001440 — 385 (2012/11)

06. ඌව පළාත් ප්‍රධාන ලේකම්, පී. බී. අමරසේකර මහතා 2012.10.15 වැනි දින සිට 2012.10.21 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.10.15 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ නිලධාරි ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් ප්‍රධාන ලේකම් තනතුරේ වැඩ බැලීමට,

07. ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ආර්. එම්. පී. රත්නායක මහතා 2012.10.14 වැනි දින සිට 2012.10.28 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.10.14 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරි ආර්. එම්. ආනන්ද මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට,

08. ඌව පළාත් සභාවේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් එල්. එල්. අනිල් විජේසිරි මහතා 2012.10.14 වැනි දින සිට 2012.10.27 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.10.14 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරි ගුණදාස සමරසිංහ මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් සභාවේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

09. මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය පී. ඩී. කේ. අධිකාරි මහතා 2012.10.14 වැනි දින සිට 2012.10.21 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2012.10.14 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, වෛද්‍ය යූ. එස්. පී. උඩුනුවර මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, මොනරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට,

10. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරි ඩී. එම්. කිරිබණ්ඩා මහතා 2012.09.29 වැනි දින සිට බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත් කරන තෙක් හෝ 2012.12.31 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

රජ වීදිය,
බදුල්ල,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

11 - 981

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.